# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2152/60 - 2019 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා - 2019.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය**

2005 අංක 6 දරන පනතින් සංශෝධිත පරිදි 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2019 නොවැම්බර් 29 දිනැති අංක 2151/52 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත එකී 2අ වගන්තිය යටතේ වන නියමය, එම නිවේදනයේ 3 වන ඡේදයට වහාම ඉක්බිතිව පහත නව ඡේදය ඇතුල් කිරීම මගින් සංශෝධනය කරමි.

''4. 1 (අ) ඡේදයේ කාර්යය සඳහා :

(i) ''මුළු යෙදවුම් වටිනාකම'' යන්නෙන් ශුන්‍ය අනුප්‍රමාණය අදාළ වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භ වීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාව තුළ මිලට ගත් භාණ්ඩ වල මුළු වටිනාකම අදහස් වේ.

(ii) ''දේශීය සැපයුම්/ප්‍රභවයන් ගෙන් ප්‍රභවය වූ යෙදවුම්'' යන්නෙන් ශුන්‍ය අනුප්‍රමාණය අදාළ වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භ වීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාව තුළ දේශීයව නිෂ්පාදනය කළ කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක, ධීවර, සත්ව පාලන හෝ කිරි නිෂ්පාදන සහ අවම වශයෙන් 10% ක දේශීය අගය එකතු කිරීමක් සහිත නිෂ්පාදන මිළදී ගැනීම සඳහා දරන ලද මුළු වියදම අදහස් වේ.''

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දීය.

12 - 742